55. ජීවක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදි. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කෝමාරභච්ච නම්වූ ජීවක යන්ගේ අඹ උයනෙහි (කරවන ලද විහාරයෙහි) වැඩ වාසය කරති. එකල්හි වනාහි ජීවක නම් කොමාරභච්ච තෙමේ භග්‍යවතුන් වහන්සේ යම් තැනක්හිද එතැනට පැමිණියේය. පැමිණ භග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක සිටියේය. එක් පැත්තක සිටි ජීවක නම් කොමාරභච්චතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. ,ස්වාමීනි, මා විසින් මෙය අසනලදි. .ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්, ශ්‍රමණ ගෞතම තෙමේ දැන ගෙන උදෙසා කරන ලද (තමන් පිණිස පිළියෙල කරනලද) ඒ මාංසය වළඳන්නේය. යනුයි. ස්වාමීනි, යම් ඒ කෙනෙක් මෙසේ කීවාහුද? .ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්. ශ්‍රමණ ගෞතමතෙමේ ඒ දැනගෙනද තමන් උදෙසා කරනලද ඒ මාංසය වළඳන්නේයයි. (කියායි). ස්වාමීනි කිමෙක්ද ඔවුහු භග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නාහුද? භග්‍යවතුන් වහන්සේට බොරුවෙන් දොස් කියන්ද? භග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද කාරණයට අණුව කරුනු කියන්ද? කිසියම් කරුණු සහිතවූ වාදානුවාදයෙක් ගැරහියයුතු තැනට නොපැමිණේදැයි, (ඇසීය).

2., ජීවකය, යම් ඒ කෙනෙක් මෙසේ කීවාහුද? .ශ්‍රමණ ගෞතමයන් උදෙසා සතුන් මරත්. ශ්‍රමණ ගෞතම තෙමේ දැනගෙන උදෙසා කරනලද ඒ මාංසය පරිභෝග කරන්නේ යයි. (කියායි.) ඔවුහු මා විසින් කියන ලද්දක් කියන්නාහු නොවෙත්. ඔවුහු මට බොරුවකින් දොස් කියන්නාහුද වෙත්. ජීවකය, මම වනාහී කරුනු තුනකින් යුතක්තවූ මාංසය පරිභෝග නොකට යුතුයයි කියමි. මේ මාන්සය පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව **දක්නා ලද්දේය**, මේ මාන්සය පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව **අසන ලද්දේය**, මේ මාන්සය පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව **සැක කරන ලද්දේය**, යන තුනයි. ජීවකය, මම වනාහී මේ කරුණු තුනෙන් යුක්තවූ මාංසය අනුභව නොකට යුතුයයි කියමි.

ජීවකය යම් මාන්සයක් පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව නොදක්නා ලද්දේය, මාන්සයක් පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව නොඅසන ලද්දේය, මාන්සයක් පිනිස තමා සඳහාම සතකු මරණ ලදබව සැක නොකරන ලද්දේය, යන තුනයි. ජීවකය, මම වනාහී මේ කරුනු තුනින් යුක්තවූ මාංසය වැළඳිය යුතුයයි කියමි.

---

[1] (ළදරු කල කුමාරයෙකු විසින් පෝෂණය කරන ලද හෙයින් ජීවක වෛද්‍යාචාරීන්ට කෝමාරභච්ච යැයි ආරූඪ නාමයකි)

3. ,ජීවකය, මේ ශාසනයෙහි මහණදම් රකින භික්ෂුවක් එක්තරා ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරුකොට වාසය කරයි. හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිශාවක් පතුරුවා වාසය කරයි. එසේ දෙවන දිශාවය එසේ තුන්වන දිශාවය එසේ සතරවන දිශාවය, මෙසේ උඩය යටය සරසය යන සියළු දිශාවට මෛත්‍රී සිත පතුරුවයි සියල්ලෙහි සියළු තැන පතළාවූ සියල්ලෙන් යුක්තවූ ලෝකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරයි. ඒ භික්ෂුව වෙත යම් ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ සෙට දවස දානය පිණිස ආරාධනාකරයි.

ජීවකය, ආරාධනාව පිළිගත් ඒ මහණ තෙම එය ඉවසයි. හෙතෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් පසුදා පෙරවරු වේලෙහි හැඳ පොරවා පා සිවුරුගෙණ ඒ ගෘහපතියගේ හෝ ගෘහපති පුත්‍රයාගේ හෝ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණෙයි. පැමිණ පනවන ලද ආසනයෙහි හිඳියි. ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ඔහු ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් වළඳවයි. නමුදු ඔහුට මෙබඳු සිතක් නොවෙයි. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ ප්‍රණීතවූ පින්ඩපාතයෙන් මා වළඳවයි. එය ඉතා යහපත. මේ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ මින් පසුවද මෙබඳුම ප්‍රණීතවූ පිණ්ඩපාතයෙන් මා වළඳවන්නේ නම් ඉතා යෙහෙකැයි. මෙබඳු සිතක්ද ඔහුට ඇති නොවෙයි. හෙතෙම ඒ පිණ්ඩපාතය, කෙරෙහි තෘෂ්ණාවෙන් නොගැ ලුනේ රස තෘෂ්ණාවෙන් මූර්ඡා නොවූයේ එහි නොගිලුනේ ආහාරයේ ආදීනව දොස් දකිනා සුළුවූයේ නිශ්ශරණ ප්‍රඥාවෙන් යුක්තව වළඳයි. ජීවකය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම, ඒ මහණතෙම ඒ කාලයෙහි තමන්හට දුක් පිණිස හෝ සිතයිද? හෝ අන්‍යයන්හට දුක් පිණිස හෝ සිතයිද? එම දෙපසටම හෝ දුක් පිණිස හෝ සිතයි,ද?

,ස්වාමිනි, එසේ නොසිතමි, ජීවකය, ඒ මහණතෙම ඒ කාලයෙහි නිවැරදිවූම ආහාරය ගන්නේ නොවේද?, ,ස්වාමිනි, එසේය.

4., ස්වාමිනි මම මෙබඳු බසක් අසා ඇත්තෙමි. මහා බ්‍රහ්මයා මෛත්‍රී විහරණ ඇත්තෙක උපෙක්ඛා ගුනයෙන් යුතුයය එනමුදු අද භාග්‍යවතුන් වහන්සේම දැක භාග්‍යවතුන් වහන්සේම මෛත්‍රී විහරණයෙන් අනුන බැව් හැඳින්නෙමිහ.,

,ජීවකය, යම් රාගයකින්, යම් ද්වේෂයකින්, යම් මොහයකින් ක්‍රෝධ ඇත්තෙක් වන්නේද, තථාගතයන් වහන්සේගේ ඒ රාගය ඒ ද්වෙෂය ඒ මෝහය පහවූයේ සිඳිනලද මුල් ඇත්තේ මස්තකය (කරටිය) සිඳිනලද තල්ගසක් මෙන් කරන ලද්දේ නැවත නොවීම් කරන ලද්දේ, මතු නූපදනා ස්වභාව ඇත්තේවෙයි. ජීවකය, ඉදින් නුඹ විසින් මේ සඳහා කියන ලද්ද අනුදනිමියි, වදාළේය. , ස්වාමිනි, මා විසින් ඒ සඳහාම කියනලදී.,

5 , ජීවකය, යමෙක් වනාහි තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ උදෙසා සතෙකු මරාද, හෙතෙම කරුනු පසකින් බොහෝ පව් රැස්කරයි. හෙතෙමේ . "යව් අසවල්

සතා ගෙනෙව්." යන යම් වචනයක් කියයිද, මේ පළමුවන කාරණයෙන් බොහෝ පව් රැස්කරයි. ඒ සතා බෙල්ලෙන් බැඳ ගෙනෙනු ලබන්නේ යම් දුකක් දොම්නසක් විඳියිද, මේ දෙවනි කරුනෙන්ද බොහෝ පව් රැස් කරයි. හෙතෙම ."යව, මේ සතා මරව". යන මේ වචනය කියයිද, මේ තුන්වන කරුනෙන්ද බොහෝ පව් රැස්කරයි. ඒ සතා මරණු ලබන්නේ යම් දුකකි දොම්නසක් විඳියිද, මේ සතරවන කරුනෙන් බොහෝ පව් රැස්කරයි. යම් හෙයකිනුත් හෙතෙම තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ මෙසේ නොකැපවූ දෙයින් වළඳවාද මේ පස් කරුනෙන් බොහෝ පව් රැස් කරයි. ජීවකය, යමෙක් වනාහි තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවකයෙකු හෝ උදෙසා සතෙකු මරාද, හෙතෙම මේ කරුණු පසින් බොහෝ පව් රැස් කෙරේයයි, වදාළහ.

මෙසේ වදාල කලහි ජීවක නම් කොමර භව්වතෙම භගාවතුන් වහන්සේට මෙය කීයේය. ",ස්වාමීනි, ආශ්චර්‍යයකි, ස්වාමීනි, නුවූ විරූ දෙයක්ය. ස්වමීනි, භික්ෂූහු එකාන්තයෙන් කැපවූ ආහාරයක් වළඳත්. ස්වාමීනි, භික්ෂූහු ඒ කාන්තයෙන්ම කැපවූ ආහාරයම වළඳත්. ස්වාමීනි, ඉතා යහපත, ස්වාමීනි, ඉතා යහපත ස්වාමීනි යටිකුරු කරන ලද්දක් යම්සේ උඩුකුරු කරන්නේද, වැසුමක් එළිදරව් කරන්නේද, මුළාවූවෙකුට මග කියන්නේද ඇස් ඇත්තෝ රූප දකින්වායි, අඳුරෙහි තෙල් පහනක් දරන්නේද එලෙසින්ම භාගාවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය.

ස්වාමීනි, ඒ මම භාගාවතුන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සඞ්ඝයාද (සරණ කොටයමි) භගාවතුන් වහන්සේ අද පටන් දිවිහිමි කොට සරණගියාවූ උපාසකයෙකැයි මා දරණසේක්වා" යි, කීයේය.

පස්වෙනිවූ ජීවක සූත්‍රය නිමි (1–5)